# මධ්‍ය වාර පරීක්ෂණය - 2017
# බුද්ධ ධර්මය
# 8 ශ්‍රේණිය

**නම/විභාග අංකය :** **කාලය : පැය 02 යි**

**I පත්‍රය**

- **අංක 01 සිට 20 දක්වා එක් එක් ප්‍රශ්ණයට ගැළපෙන අදාල පිළිතුරු වලින් වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බුදුරජාණන් වහන්සේ තුළ පැවති ආගමික සහනශීලීත්වයට උදාහරන දෙන සූත්‍ර දේශනාව වන්නේ,
    1. පරාභව සූත්‍රය යි
    2. මහා මංගල සූත්‍රය යි
    3. රතන සූත්‍රය යි
    4. මහා සකුළුදායී සූත්‍රය යි

02. දෙව්රම් වෙහෙර කරවන ලද්දේ,
    1. කොසොල් රජතුමා ය
    2. විශාඛා මහා උපාසිකාව ය
    3. අනේපිඬු සිටුතුමා ය
    4. බිම්බිසාර රජතුමා ය

03. බෞද්ධයන්ට ඉතාමත්ම සමීපවන ධර්ම ග්‍රන්ථය වන්නේ,
    1. ධම්ම පදය යි
    2. මහාවංශය යි
    3. පන්සිය පනස් ජාතක පොත යි
    4. දීපවංශය යි

04. හේතුඵල ධර්මතාව බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම වන බව පැහැදිලි කරගත හැකි ගාථාවෙහි මුල් පදය වන්නේ,
    1. ඒකං ධම්මං අතීතස්ස
    2. නතං කම්මං කතං සාධු
    3. යේ ධම්මා හේතුප්පභවා
    4. යස්ස පාපං කතං කම්මං

05. අස්සජි හිමියන් විසින් දෙසූ දහමට අනුව මුලින්ම සෝවාන් ඵලයට පත්වූයේ,
    1. කෝලිත පිරිවැජියා ය.
    2. උපතිස්ස පිරිවැජියා ය.
    3. අක්කෝස භාරද්වාජ බමුණා ය.
    4. කසීභාරද්වාජ බමුණා ය.

06. බුදුරජාණන් වහන්සේ දෙව් මිනිස් බඹ ලෝකවල සැබෑ තත්වය අවබෝධ කරගත් බැවින් උන්වහන්සේ හැඳින්වූයේ,
    1. සම්මා සම්බුද්ධ යනුවෙනි.
    2. ලෝකවිදූ යනුවෙනි.
    3. සුගත යනුවෙනි
    4. භගවා යනුවෙනි.

07. බුද්ධානුස්සති භාවනාවේ ආනිශංසයක් නොවන්නේ,
    1. පාපයට ලැජ්ජාව සහ බිය ඇතිවීම.
    2. නපුරු සිහින නොදැකීම.
    3. සුව පහසු නින්දක් ලැබිය හැකි වීම.
    4. සිත ක්‍රමයෙන් සමාධිගත නොවීම.

08. ධර්ම රත්නයේ ගුණ සංඛ්‍යාත්මක වශයෙන්,
    1. හය කි.
    2. අට කි.
    3. නවය කි.
    4. දහය කි.

09. බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් පිළිබිඹු වන ආචාරශීලී ගුණාංගයක් වන්නේ,
1. සුභදශීලී කතා බහ ය.
2. මහා කරුණාව ය.
3. මහා ප්‍රඥාව ය.
4. නොදැමුණු පුද්ගලයන් දමනය කිරීම ය.

10. පංච වරයන්ට අයත් නොවන්නේ,
1. ආරණ්‍යක විය යුතුය යන්නයි.
2. පාංශුකූලික විය යුතුය යන්නයි.
3. පිණ්ඩපාතික විය යුතුය යන්නයි.
4. මස් මාංශ වැළදිය යුතුය යන්නයි.

11. “යෝ වදතං පවරෝ මනුජේසු” යන ගාථාව ආරක්ෂිත ගාථාවක් ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද්දේ,
1. සෝපාක නම් අසරණ ළමයාට ය.
2. සුනීත නම් කසල ශෝදක තරුණයාට ය.
3. ජන්ත මානවක නම් තරුණයාට ය.
4. සිගාල නම් ගෘහපතියාට ය.

12. ශිෂ්ට සම්පන්න සමාජයක් ඇතිවීමට හිරිඔත්තප්ප වැදගත් වේ. හිරිඔත්තප්ප යනුවෙන් හැඳින්වෙන්නේ,
1. යම් ක්‍රියාවක් කරන විට ඇතිවන උවමනාව යි.
2. යම් ක්‍රියාවකදී ඇතිවන කලකිරීම යි.
3. යම් ක්‍රියාවකදී ඇතිවන ප්‍රබෝධය යි.
4. පව් කිරීමට ඇති ලැජ්ජාව සහ බිය යි.

13. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම මංගල ධර්ම දේශනාව වනුයේ,
1. ධම්මචක්ක පවත්තන සූත්‍රය යි.
2. චුල්ල කම්ම විභංග සූත්‍රය යි.
3. චුල්ලහත්ථිපදෝපම සූත්‍රය යි.
4. සච්ච විභංග සූත්‍රය යි.

14. සිංහල බෞද්ධ නිවසක අවමගුලක් වූ විට මෘත ශරීරය අසල පොල්තෙල් පහනක් දල්වන්නේ,
1. මෘත ශරීරයට ආලෝකයක් ලබා දීමට.
2. විෂබීජ විනාශ වීමට ය.
3. මෘත ශරීරය කල්තබා ගැනීමට ය.
4. මෘත ශරීරය හොඳින් දැක බලා ගැනීමට ය.

15. ගුත්තිල කාව්‍යය රචනා කරන ලද්දේ,
1. රාහුල හිමියන් ය.
2. බුද්ධපුත්‍ර හිමියන් ය.
3. වැත්තෑවේ හිමියන් ය.
4. මෛත්‍රී හිමියන් ය.

16. චතුරාර්ය සත්‍ය ධර්මයට අනුව දුකට හේතුව තණ්හාවයි. තණ්හාවේ ප්‍රභේද තුනකි. ඉන් එකක් ලෙස දැක්වෙන කාම තණ්හාව යනු,
1. කම්සැප විඳීමට ඇති ආශාව යි.
2. නැවත නැවත භවයක ඉපදීමට ඇති ආශාව යි.
3. නැවත භවයක් නැතැයි, මේ භවයේ සැප විඳීමේ ආශාව යි.
4. සියළු සැප සම්පත් විඳීමේ ආශාව යි.

17. භික්ෂූන් වහන්සේලාගේ මනා පැවැත්මට පනවා ඇති උසස් සිරිත් විරිත් මාලාව හැඳින්වෙන්නේ,
1. විනය නීති නමිනි.
2. උපසම්පදා කර්මය නමිනි.
3. සේඛියා ධර්ම නමිනි.
4. ඇවැත් නමිනි.

18. උපාය කුසලතාවයෙන් යුතුව ගැටළුවලට මුහුන දීම හා ඒවා විසඳා ගන්නා ආකාරය පිළිබඳව සඳහන් වන ජාතක කතාව වන්නේ,
   1. වට්ටක ජාතකය
   2. අපණ්ණක ජාතකය
   3. ලෝමහංස ජාතකය
   4. උම්මග්ග ජාතකය

19. දුක්ඛ සත්‍ය පිළිබඳ ආකාර 03ක් පවතී. එයට අයත් නොවන්නේ,
   1. සාමාන්‍ය දුක
   2. මානසික දුක
   3. වෙනස්වීම පිළිබඳ දුක
   4. සංස්කාර පිළිබඳ දුක

20. සිව් බඹ විහරණයන්ට අයත් නොවන්නේ,
   1. මෛත්‍රීාව යි
   2. ප්‍රඥාව යි.
   3. කරුණාව යි.
   4. මුදිතාව යි.

---

## II කොටස

## පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

**(01)**

1. දේවදත්ත හිමියන් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලන ලද පංච වරයෙන් දෙකක් නම් කරන්න.
2. ධර්ම රත්නයේ ගුණ දෙකක් සඳහන් කරන්න.
3. බුද්ධානුස්සති භාවනාවේ ආනිශංස 02ක් ගෙනහැර දක්වන්න.
4. "යේ ධම්මා හේතුප්පභවා" යන ගාථාව සම්පූර්ණ කරන්න.
5. සිරිත් විරිත් හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
6. දුක්ඛ සත්‍යයේ ආකාර තුනෙන් දෙකක් සඳහන් කරන්න.
7. භාවනාව සඳහා ශිෂ්‍යයන් හා ශිෂ්‍යයාවන් හිඳගත යුතු ඉරියව් දෙක පිළිවෙලින් ලියන්න.
8. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" යන පාළි පාඨයේ අර්ථය ලියන්න.
9. බුදු දහමට අනුව ඇඳුමක් ඇඳීම තුළින් බලාපොරොත්තුවන අරමුණු දෙකක් ලියන්න.
10. පඤ්චස්කන්ධයට අයත් ස්කන්ධ දෙකක් නම් කරන්න.

**(02)**

1. බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් පිළිබිඹු වන ආචාරශීලී ගුණාංගයන් දෙකක් නම් කරන්න.
2. ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න.
3. එම ගුණාංග පිළිපැදීම තුළින් ශිෂ්‍ය ජීවිතය සාර්ථක කරගැනීමට හැකිවන අයුරු පැහැදිලි කරන්න.

**(03)**

1. බුද්ධානුස්සති භාවනාව යනු කුමක්ද? කෙටියෙන් හඳුන්වන්න.
2. නව අරහාදී බුදු ගුණ අතුරින් ගුණ තුනක් තේරුම් සහිතව ලියා දක්වන්න.
3. යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා බුදුගුණ භාවනාව වැඩීම තුළින් ලදහැකි ප්‍රතිඵල ඇගයීමකට ලක් කරන්න.

**(04)**

1. “යෝච පුබ්බේ පමජ්ජිත්වා” යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කරන්න.
2. එහි අදහස ගෙනහැර දක්වන්න.
3. නොපමාව කටයුතු කිරීම තුලින් සැනසිලිදායක ජීවිතයක් ගත කළ හැකි අයුරු ඉහත ධම්ම පද ගාථාව ඇසුරෙන් පැහැදිලි කරන්න.

**(05)**

1. සීලය යනු කුමක්ද? අර්ථ දක්වන්න.
2. පංචසීලයට අයත් නොවන අෂ්ටාංගික සීලයට අයත් ශික්ෂාපද තුනක් ගෙනහැර දක්වන්න.
3. “පානාතිපාතා වේරමනී සික්ඛාපදං සමාදියාමි” මෙම සිල්පදය ආරක්ෂා කිරීමෙන් ඇතිවන යහපත පෙන්වා දෙන්න.

**(06)**

1. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් වන ආකාරයට අඹුදරුවන් හා හිතමිතුරන් අයත් දිශාවන් නම් කරන්න.
2. සිගාලෝවාද සූත්‍රයට අනුව තමාගෙන් මිතුරාට ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න.
3. යහපත් අඹුසැමි සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා ස්වාමියාගෙන් බිරිඳටත්, බිරිඳගෙන් ස්වාමියාටත් ඉටුවිය යුතු යුතුකම් පැහැදිලි කරන්න.

**(07)**

1. තණ්හාවේ ප්‍රධාන ප්‍රභේද තුන නම් කරන්න.
2. ඉන් එකක් පැහැදිලි කරන්න.
3. තණ්හාව දුකට හේතුවන ආකාරය පෙන්වා දෙන්න.

## 8 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය - I කොටස

| ප්‍රශ්නය | පිළිතුර | ප්‍රශ්නය | පිළිතුර |
|---|---|---|---|
| **1** | 4 | **11** | 3 |
| **2** | 3 | **12** | 4 |
| **3** | 1 | **13** | 1 |
| **4** | 3 | **14** | 2 |
| **5** | 2 | **15** | 3 |
| **6** | 2 | **16** | 1 |
| **7** | 4 | **17** | 3 |
| **8** | 1 | **18** | 4 |
| **9** | 1 | **19** | 2 |
| **10** | 4 | **20** | 2 |

## 8 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය - I I කොටස

(01)

1. භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම ආරණ්‍යයක විය යුතුයි.
   භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම පිණ්ඩපාතික විය යුතුයි.
   භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම පාංශුකූලික විය යුතුයි.
   භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම වෘක්ෂමූලික විය යුතුයි.
   භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම මස් මාංශ වැළඳීමෙන් වැලකී සිටිය යුතුය.
2. ස්වාක්ඛාතො භගවතා ධම්මො/ සන්දිට්ඨිකො/ අකාලිකො/ එහිපස්සිකො/ ඕපනයිකො/ පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි
3. 5වන පාඩම, 34 පිටුව බලන්න.
4. යෙ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ
   තේසංච යෝ නිරෝධෝ - ඒවං වාදී මහා සමනො
5. චාරිත්‍ර, වාරිත්‍ර
6. දුක්ඛ දුක්ඛතා / සංඛාර දුක්ඛතා / විපරිනාම දුක්ඛතා
7. ශිෂ්‍යයන් - බද්ධ පර්යංකය
   ශිෂ්‍යාවන් - අර්ධ පර්යංකය
8. මහණෙනි, චේතනාව කර්මය යැයි දෙසමි(කියමි)
9. නොවැසුණහොත් ලජ්ජා ඇතිවන තැන් වසා ගැනීම.
   මැසි මදුරු උවදුරුවලින් ආරක්ෂා වීම.
   අව්ව,වැස්ස,සුළඟ ආදියෙන් වන විපත් වලින් ආරක්ෂා වීම.
10. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ

(02)

1. සුහදශීලී කතාබහ / ආගන්තුක සත්කාරය / මහජන මතයට ගරු කිරීම/ අල්ප ශබ්දතාව/ නිහතමානී බව
2. අදාල කරුණු සළකා බලා ලකුණු දෙන්න.(2වන පාඩම 10-16 දක්වා පිටු)
3. අදාළ බව සළකා ලකුණු දෙන්න.

(03)

1. නව අරහාදී බුදුගුණ සිහිකරමින් කරනු ලබන භාවනාව
2. 5වන පාඩම. 37/38 පිටු බලන්න.
3. භාවනාවෙන් ලද හැකි ප්‍රතිඵල තුළින් ජීවිතය සාර්ථක කරගන්නා අයුරු විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(04)

1. යෝච පුබ්බේ පමජ්ජිත්වා - පච්ඡා සෝ නප්පමජ්ජති
   සෝ ඉමං ලෝකං පභාසේති - අබ්භාමුත්තෝව චන්දිමා
2. යම් කෙනෙක් මුලදී පමා වුවත් පසුව නුවණින් විමසා බලා නොපමාව කටයුතු කරන්නේ නම් හෙතෙම වළා ගැබින් මිදුණු පුන් සඳමෙන් මුළු ලෝකයම බබළවයි.
3. අදාළත්වය සළකා බලා සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(05)

1. කය වචන දෙකෙහි සංවරය සීලය යි.
2. අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි
   විකාලභෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි
   නච්චගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි.
3. 9 වන පාඩම 62 පිටුව බලන්න.

(06)

1. අඹුදරුවන්- බටහිර දිශාව
   හිතමිතුරන් - උතුරු දිශාව
2. දානය / ප්‍රිය වචනය / අර්ථචර්යාව / සමානාත්මතාවය / නොරුවටීම
3. අදාල බව සළකා සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(07)

1. කාම තණ්හා / භව තණ්හා / විභව තණ්හා
2. 14 වන පාඩම. 97/98 පිටු බලන්න.
3. 14 වන පාඩම. 97/98 පිටු බලන්න.